# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

REACHING NATIONS

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII | JUNE 2023 | Issue No. 07


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 47:1-9)**

01. සියලු රෑ මනුෂ්‍ය වර්ගයෙනි, අත්පොළසන්දෙව්; ජයනාදයෙන් දෙවියන්වහන්සේට හඬනගව්.

02. මක්නිසාද මහෝත්තමවූ ස්වාමීන්වහන්සේ භයංකරය; උන්වහන්සේ මුළු පොළොව කෙරෙහි මහත් රජෙක් වනසේක.

03. උන්වහන්සේ අපට මනුෂ්‍ය වර්ගයන්ද අපේ පාදවලට ජාතීන්ද යටත්කර දෙනසේක.

04. උන්වහන්සේ තමන්ට ප්‍රියවූ යාකොබ්ගේ මහිමය නැමැති අපේ උරුමය අප සඳහා තෝරාදෙනසේක.

05. දෙවියන්වහන්සේ ජයඝෝෂාවක් ඇතුව නැගී ගියසේක, ස්වාමීන්වහන්සේ හොරණෑ ශබ්දයක් ඇතුව නැගී ගියසේක

06. දෙවියන්වහන්සේට ප්‍රශංසා ගී කියව්, ප්‍රශංසා ගී කියව්. අපේ රජ්ජුරුවන්ට ප්‍රශංසා ගී කියව්, ප්‍රශංසා ගී කියව්.

07. මක්නිසාද දෙවියන්වහන්සේ මුළු පොළොවට රජ්ජුරුවෝය. අර්ථ දැන ප්‍රශංසා ගී කියව්.

08. දෙවියන්වහන්සේ ජාතීන් කෙරෙහි රජකම්කරනසේක. දෙවියන්වහන්සේ ස්වකීය ශුද්ධ සිංහාසනයෙහි වැඩහිඳිනසේක.

09. ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේගේ සෙනඟ වන පිණිස, මනුෂ්‍ය වර්ගයන්ගේ අධිපතීහු රැස්ව සිටිති. මක්නිසාද පොළොවේ පිරිස් දෙවියන්වහන්සේට අයිතිය; උන්වහන්සේ අතිශයින් උසස්ව සිටිනසේක.

## නව සෘතුව වැළඳගන්න. එසේ නොවුනහොත් එය ඔබට බාධා කිරීමක් ලෙස නම් කෙරෙයි.

## EMBRACE THE NEW SEASON OR YOU CAN NAME IT AS DISTRACTIONS!


(සහෝදරී එන්ජල් කුමාරි විසිනි)




යෝෂුවා පොත නව සෘර්තුවක ආරම්භයකි. ඉශ්‍රායෙල් ඉතිහාසයෙහි සිටි ඉතාම බලවත්වූ නායකයෙක් වන මෝසෙස්ගේ මරණයෙන් පසු ඉශ්‍රායෙල් සෙනඟට නව සෘර්තුවකට මුහුණ දීමට සිදු විය. මෝසෙස්ගේ ස්ථානයට යෝෂුවා පත් කරනු ලැබීය. ඔහු ඉදිරියේ විශාල වගකීමක්ද තිබුණි. යෝෂුවාට මෙය පහසු වගකීමක් වූයේ නැත යෝෂුවා මෝසෙස්ගෙන් පුහුණුව ලබා තිබුණත් මෙවැනි විශාල වගකීමක් ඔහුට දැරීමට සිදුවන බව දැනගත් විටදී ඔහු මනස තුලට මොනාකාර සිතුවිලි පැමිණුනාද කියා නොදනී. ඔහු මෝසෙස් සමඟ සිටි නිසා මෝසෙස් කළාවූ හැමදේම දැනගෙන සිටියාය. තවද ඉශ්‍රායෙල් සෙනඟ මෝසෙස්ට විරුද්ධව ක්‍රියා කලේ කෙසේද කියා ඔහු දැනගෙන සිටියේය. අවසානයේදී


3 වෙනි පිටුවට ...


## කරුණාකර අප උදෙසා යාච්ඤා කරන්න.





**PLEASE PRAY FOR US**

කැඳවීමේ ප්‍රතිරාවය ඉන්දියාවේ සිට ලංකාවට තැපැලෙන් එවන පිණිස එක් මසකට විශාල පිරිවැයක් (එක් පත්‍රිකාවකට Rs.31/- ක මුදලක්) දැරීමට සිදුවී තිබේ. එම නිසා කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව ශ්‍රී ලංකාවෙහිම මුද්‍රණය කර බෙදා හැරීමට උපකාර කරන්නය කියා අප දෙවියන්වහන්සේට ස්තුති කරමු.

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS

*from your dearly beloved brother...*



# කැඳවීමේ ප්‍රතිරාවය



".... නමුත් අප, අපේ දෙවියන්වහන්සේට යාච්ඤාකොට ඔවුන් නිසා රෑ දවල් ඔවුන්ට විරුද්ධව මුරතැබීමුව...." (නෙහෙමියා 4:9)

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රේමණීය මිත්‍රය,**

ඔබට සමාදානය වේවා! අපි ඔබව යාච්ඤාවෙන් දරාගත්තෙමුව. කරුණාකර මෙම පණිවිඩය අන්තිම දක්වාම කියවන්න.


ස්වාමීන්වහන්සේ අපට ආශිර්වාද කර තිබේ. උන්වහන්සේ අපට අවශ්‍ය ශක්තිය, ආරක්ෂාව හා සියලුම පහසුකම් දී තිබේ. අප ගැන බලාසිටි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යහපත්ය. උන්වහන්සේ සැමවිටම ඔබ සමඟ සිටින සේක.

## ඔබ ඔබගේ මනසෙහි තබා ගත යුතු වැදගත් තොරතුරු

(01). සෑම දිනකම රාත්‍රී 10.00 ට අපගේ යාච්ඤා කාලයයි! ඔබ කුමන රටක හෝ නගරයක සිටියද රාත්‍රී 10.00 ට දරුවන් නිසාත් තරුණ තරුණියන් නිසාත් මුළු ලෝ තලයෙහිම සිටින්නාවූ අපගේ මෙම අනාගත පරම්පරාව වන දරුවන් උදෙසා යාච්ඤා කරමු. අප මෙම සේවය හඳුන්වන්නේ 'යෞවනයන් හා දරුවන් පිළිබඳ ගෝලීය දර්ශනය' යනුවෙනි. මෙම සේවය තුළින් දෙවියන්වහන්සේ පිරිමි සහ ගැහැණු දරුවන්ට ආශිර්වාද කරනු ලබති. මේ සම්බන්ධව ඇති තොරතුරු දැනගැනීමට ඔබ අපගේ කැඳවීමේ ප්‍රතිරාවයේ YouTube නාලිකාව නැරඹීමට හැකිය. අපගේ මෙම YouTube චැනලයට ඔබගේ කැමැත්ත ප්‍රකාශ කිරීමටද හැකිය. මෙම නාලිකාව හරහා විවිධ අයගේ ජීවිත සාක්ෂි, යාච්ඤා ඉල්ලීම් හා කෙටි පණිවිඩයකට සවන්දීමට හැකිය. අපගේ ජංගම දුරකථන අංකය හා WhatsApp අංක එනම්, +91-98-41071858 සහ +91-9841271858 ඔබගේ ළඟ තබා ගන්න. අපගේ සේවාවන් සඳහා පාවිච්චි කරනු ලබන්නේ මෙම අංකයන්ය.

(02). උදෑසන 5.00 ට කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ YouTube චැනලය හරහා දෙවියන්වහන්සේගේ පණිවිඩය හා යාච්ඤාවක් විකාශනය කෙරේ. මෙම සියලු පණිවිඩ පාස්ටර් සෑම් සෙල්ව රාජ් සහ පාස්ටර් ඇලෙක්ස් සැම්සන් සෑම් විසින් බෙදා ගනු ලබයි. ඔවුන්ගේ WhatsApp අංක නම්, +91-98410 71858 සහ +98-9141271858 වෙයි. ඔබ මෙම චැනලද බැලීම තුල ඔබට ආශිර්වාදය ලැබෙයි කියා අපි විශ්වාස කරමු. මෙම අංක ඔබගේ දුරකථනයෙහි තබා ගන්න. (Save) ය කියා ඉල්ලා සිටිමු.

(03). අප ගම්මානයෙහි පවත්වාගෙන යනු ලබන ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේශන් පාසල ඉතා සාර්ථකව පවත්වාගෙන යාමට හැකි වී තිබේ. මෙම පාසලේ ඉතා උසස් අධ්‍යාපන ක්‍රමයක් යටතේ පවත්වාගෙන යනු ලබන අතර ආත්මික වූ කාරණාද උගන්වමු. අපට තවත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ හොඳ ගුරුවරුන්ගේ අවශ්‍යතාවයන් ඇත. කරුණාකර අපගේ මෙම පාසල උදෙසා යාච්ඤා කරන්න.



*St. Paul's Matriculation School Staff*

## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Rev. Dr. K.R. Rajasekaran
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858
CORE LEADERS
Bro. K. Puratchivendan
Dr. Rabinder Boaz, M.S.
Bro. A. Edward Durai
Bro. A. Alvin
Bro. K. Abraham
Sis. Dhanalakshmi Chinnaiah
E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) • BIBLECOR - Postal Courses (3 languages) • Media Ministry • Online Courses • Theological Correspondence Courses (2 languages) • Church Planting • Nehemiah Bible Colleges • Gospel Printing Press • Great Commission Partners • St. Paul's Matriculation School • Crusades • Community Development



*Nehemiah Bible College Meeting*

(04). අපගේ නෙහෙමියා බයිබල් විදුහලෙහි හින්දි සහ දමිළ භාෂාවන්ගෙන් පාඩම් මාලාවන් පවත්වාගෙන යනු ලබයි. මෙහි නේවාසිකව හෝ සවස් කාලීන පාඩම් මාලාවන් වලට සහභාගිවීමට හැකිය. මෙම විදුහලෙහි චෙන්නෙයි වල සිටින ඉතාම උසස් මට්ටමේ ගුරුවරුන් විසින් ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබයි. අපට සේවය කිරීමට දෙවියන්වහන්සේගේ හස්තය අප හා සමඟ තිබෙන නිසා අපි දෙවියන්වහන්සේට ස්තුති කරමි.

අපගේ සභාවන් වල තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාවද, මුද්‍රණාලය, ළමා සේවය, තරුණ සේවය, රෝහල් සේවය යන මේ බොහෝ සේවාවන් වලට දෙවියන්වහන්සේගේ හස්තය අප හා සමඟ තිබෙන නිසා අපි උන්වහන්සේට ස්තුති කරමු. දෙවියන්වහන්සේගේ සුභාරංචිය ප්‍රකාශ කරන්නය කියා ස්වාමීන්වහන්සේ අපට විශාල ලෝකයක් දී තිබේ. මේ ශුභාරංචිය බෙදා හැරීමට හා අපට උපකාර කිරීමට විශාල දේව දාසයින් පිරිසක් හා දෙවියන්වහන්සේගේ මිනිසුන් අවශ්‍යව ඇත.

කරුණාකර අප උදෙසා යාච්ඤා කරන්න. අපට බොහෝ ආත්මික සටන් ඇත. නමුත් දෙවියන්වහන්සේ අපට ජයග්‍රහණය දෙමින් තිබේ. අප ඔබ උදෙසාද යාච්ඤා කරමු. අපගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරමු.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**
**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්**
E.mail : samselvaraj333@gmail.com
(+91) 98412 71858 / 98410 71858,

*1 පිටුවෙන්....*

මෝසෙස්ට සිදුවූයේ කුමක්ද කියා ඔහු දැන සිටියේය. මේ සියලු කාරණාවන් මෝසෙස්ගේ මනස තුළ තිබෙන්නට ඇත. නමුත් මෝසෙස් යෝෂුවා මත දෑත් තබා මේ විශාල වූ සේවයට ආලේප කරනු ලැබීය. ද්විතිය කථාව 34:9 හි මෙසේ පවසයි.

***''මෝසෙස් තමාගේ අත් නූන්ගේ පුත්‍රවූ යෝෂුවා පිට තැබූ බැවින් ඔහු ප්‍රඥාවේ ආත්මයෙන් පූර්ණ වුණේය. ඉශ්‍රායෙල් පුත්‍රයොන්ද ඔහුට කීකරු වී ස්වාමීන්වහන්සේ මෝසෙස්ට අණ කල ලෙස කලෝය.''***

මේ සියල්ල මෙසේ සිදුවුවත් යෝෂුවාගේ විශ්වාසවන්තකම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන්නට ඇත කියා මා සිතමි. යෝෂුවා පොතේ පළමු පරිච්ඡේදයෙහි දෙවියන්වහන්සේ කථා කරමින්, ''ශක්තිමත්ව ධෛර්යවත්ව සිටපන්න. මම මෝසෙස් සමඟ සිටියාක් මෙන් නුඹ සමගත් සිටින්නෙමි.'' කියා පවසන්නට ඇත්තේ ඒ නිසා විය හැකිය.

දෙවියන්වහන්සේ අපගෙන් සමහර අයව අලුත් කර්තව්‍යක් උදෙසා කැඳවනු ඇත. පරණ දේ ඉතා හොඳය. නමුත් අලුත් දෙයක් අප අපගේ ජීවිතයෙහි වැළඳගත යුතුයි. ඔබ අතරින් සමහර පුද්ගලයින්, 'මගේ ජීවිතයෙහි මා අවසානයට පැමිණ සිටියි. මගේ ජීවිතයට නව සෘර්තුවක් කොහෙන්ද?'' කියා පවසනු ඇත. බර්සිල්ලයි අවුරුදු 80 ක් වයසැති මනුෂ්‍යයෙකි. නමුත් ඔහු දාවිත්ට උපකාර කලේය. ***(2 සාමුවෙල් 19:32)*** ඔබ සූදානම් නම්, ඔබ කැමති නම් ඔබව නව සෘර්තුවක් වෙත ගෙනයාමට දෙවියන්වහන්සේට පුළුවනි.

අප අලුත් කර්තව්‍යකට පා තැබීමට අවශය නම්, සමහර දේ අප අත්හැරිය යුතුය. අප පරණ දේම අල්ලාගෙන සිටියහොත් දෙවියන්වහන්සේ අපව ගෙන යන්නාවූ අලුත් ආශිර්වාදය මුළුමනින්ම භුක්තිවිඳීමට නොහැකි වනු ඇත.

## (1). නව සෘර්තුව

යෝෂුවා 1:2 පදය ආරම්භ වන්නේ මේ ආකාරයෙනි.

***''මාගේ මෙහෙකරුවූ මෝසෙස් මලේය, එබැවින් දැන්***

## VERY URGENT ANNOUNCEMENT!

Due to unfavourable circumstances, many Christian magazines could not be published. This situation can also be experienced by our magazines **Echo of His Call**. We send our magazines after hard work and great difficulty. But we understand that postal personnel are not delivering the newspapers sincerely. Even after delivery, certain readers are not opening and reading it.

So if you really want to receive the **Echo of His Call** magazine, and if you are a person who eagerly read this magazine, kindly send us immediately your **correct address, mobile number and your e-mail address through your telephone, or WhatsApp or text message or e-mail or through post.** We will find some way to send our magazine to you. We may not be able to continue to send **Echo of His Call** magazine to you if we don't get your latest addresses with the necessary details. We don't want to lose your contact or relationship under any circumstance. Please do co-operate.

Our address:
**Echo of His Call**
10, Mohammed Abdullah 2nd Street, Chepauk. Chennai – 600 005.
Mobile No : +91-98410 71858, +91-98412 71858
Telephone No. (+91-44) 2852 8282, 2852 9293, 2854 7766
E-mail : sam@echoofhiscall.org / echosamselvaraj@gmail.com.
YouTube Channel: Echo of His Call.

***නුඹත් මේ මුළු සෙනඟත් නැගිට මා විසින් ඔවුන්ට එනම්, ඉශ්‍රායෙල් පුත්‍රයන්ට දෙන දේශයට මේ යොර්දානෙන් එතරව පලයල්ලා.''***

මේ පදයෙහි සඳහන් කර තිබෙන සමහර වචන මා ඔබ වෙතට ගෙනෙන්ට කැමතියි.

මාගේ මෙහෙකරුවා වූ මෝසෙස් මිය ගියේය. එනම්, පරණ සියල්ල පහවිය. දේව වචනය තුළ දැන් කියන පදයෙන් අර්ථවත් කරනු ලබන්නේ නව සෘර්තුවක් පිළිබඳවයි. ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේ ඔබ උදෙසා තබා තිබෙන්නාවූ ඊළඟ කර්තව්‍යයට සූදානම් වී ඉදිරියට පා තැබීමට කාලය දැන්ය. ඔබගේ සේවයේ ඊළඟ කර්තව්‍යයට ගෙනයාමේ සූදානම දැන්ය. ඔබට නව සෘර්තුවකට පැමිණ තිබේ. දෙවියන්වහන්සේගේ දයාව ඔබටත් ඔබගේ පවුලටත් ඔබගේ නිවැසියන්ටත් ලැබෙන්නාවූ කාලයයි. ඔබට අලුත්වූ දෙයක් අල්ලාගැනීමට වේලාව නම්, දැන්ය.

## (2). සූදානම් වෙන්න.

මෙම පදයෙහි ඊළඟ වචනය, ලෙස සඳහන් කරනු ලබන්නේ, යෝෂුවාට සූදානම් වෙන්න කියා දෙවියන්වහන්සේ පවසයි. අපගේ ජීවිතයෙන් ඉදිරියට පා තැබිය යුතු කාරණාවන් ගැන අප දන්නේ නැති නම් ඒ පිළිබඳව ස්ථිරත්වයක් නැතිනම් අප සාමාන්‍යයෙන් සූදානම් වෙන්නේ නැත. මෙය කියවන්නාවූ කී දෙනෙක් ඔබ දෙවියන්වහන්සේ ඉදිරියේ බලා සිටිමින් බවත් උන්වහන්සේ ඔබව අලුත් කර්තව්‍යයක් සඳහා ගෙන යාමට ඊළඟ පියවර ගැනීමට සූදානම්ව සිටිය යුතුද කියා ඔබ දන්නවාද?

ප්‍රිය මිත්‍රවරුනි ඔබගේ ජීවිතයේ අලුත් කර්තව්‍යයක් කිරීමට කාලය මෙයයි. ප්‍රශ්නය නම්, ඔබ එය වැළඳගැනීමට සූදානම්ද? අපගේ ජීවිතයේ ඊළඟ පියවර තබා ඉදිරියට යාමට ඇදහිල්ල කරණකොට ගෙන අප අපවම සූදානම් කරගනිමුව.

ඔබ ඉදිරියට නොයාමට බාධා කරන්නේ කුමක්ද කියා සිතන්න. දෙවියන්වහන්සේගේ පොරොන්දු ඔබ සිහිකල යුතුයි දෙවියන්වහන්සේගේ වචනය නොමැතිව ඉදිරියට යාම ගැන නොහිතන්න. අපගේ ජීවිතය ඉතා කෙටිය. එම නිසා ඉදිරියට යාමට පියවරක් ගන්න. සදහටම පැවතීමට යන්නේ අප ස්වාමීන්වහන්සේ උදෙසා කළාවූ දේ පමණි. එබැවින් තවත් ප්‍රමාද නොවන්න. කාලය නම් දැන්ය. එබැවින් ඉදිරියටම යාමට සූදානම් වෙන්න. ඔබ එක් පියවරක් ගන්නා විටදී ඔබ යන්නාවූ ගමන තුළදී සියලුම දේ සාර්ථකව සිදුවෙන්නට යනවා. යෝෂුවා 3:13 වෙනි පදයෙහි අපි මෙසේ කියවමු.

***''මුළු පොළොවට ස්වාමීවූ ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙනයන පූජකයන්ගේ පතුල් යොර්දාන් ජලයේ තබන විට යොර්දාන් ජලය එනම් ඉහළින්, එන ජලය නැවතී එක ගොඩක් වී සිටිනවා ඇත.''***

ඔබ පළමු පියවර ගැනීමට තීරණය කල විට ඔබ ඉදිරියේ තිබෙන්නාවූ බාධා ඉවත්වී ඔබට යාමට මාර්ගයක් විවෘත වෙයි. එබැවින් ඔබ සූදානම්ද?

## (3). එතෙරවෙන්න

දෙවියන්වහන්සේ යෝෂුවාට කථා කොට වේලාව දැන්ය. සූදානම් වී ගඟෙන් එගොඩවෙන්න කියාය.

එතෙරවීම යනු එක් වීමට සිදුවෙන්නාවූ දෙයක් නොවේය. ඔබ එගොඩවීමට නම් දිගටම යා යුතුය. ඔබ නොදන්නාවූ මාර්ගයකින් ඔබට යාමට සිදුවෙනු ඇත. ඉශ්‍රායෙල් සෙනඟට යොර්දානෙන් එගොඩ වෙන්නය කියා දෙවියන්වහන්සේ පැවසුවේය. ඔවුන් එගොඩවූයේ කෙසේද? එය මනුෂ්‍ය මනසින් සිතා ගැනීමටවත් බැරිය. මා ප්‍රිය මිත්‍රවරුනි, දෙවියන්වහන්සේ ඔබට පොරොන්දුවක් දෙන විටදී ඔබ ඔබගේ ආත්මික ඇස්වලින් එය දැකීමට පුරුදු විය යුතුය. ඔබගේ මාංෂික ඇස් වලින් එය දකින්නේ නැතිව දෙවියන්වහන්සේ ඉදිරියේ ආත්මික දැස් වලින් එය දකින්න. අපගේ මාංෂික ඇස්වලින් අප බැලුවහොත් අපිට දීර්ඝ දුරක් දැකීමට බැරිය. අප දකින්නේ අප වටකර ඇති වතුර සහ රැල්ල පමණී. වතුර සහ රැල්ලෙහි සැරකම නිසා අපට දැනෙන්නේ භයක් පමණී. එනිසා කිසිදිනක අපට ගඟෙන් එගොඩවීමට බැරිය. නමුත් අප ආත්මික ඇස් වලින් දැකීමට පටන්ගතහොත් අප හිතනවාටත් වඩා දේ දෙවියන්වහන්සේ අප උදෙසා කරන ආකාරය අපට දැකගැනීමට හැකිය. බයිබලයේ එපීස 3:20 හි සඳහන්ව ඇති කාරණය මා ඉතා ප්‍රිය කරන කොටසකි. එහි මෙලෙස සඳහන් කරයි. ඉතින් අප තුළ ක්‍රියා කරන්නාවූ බලයේ හැටියට අපි ඉල්ලන නොහොත් සිතන හැම දේට වඩා ඉතා අධික ලෙස කරන්ට බලය ඇත්තාවූ තැනැන්වහන්සේටම, කියා පවසයි. මෙහිදී දෙවියන්වහන්සේ සෑම මොහොතකදීම ක්‍රියා කරන බව පවසයි. එනම්. උන්වහන්සේගේ ක්‍රියා කිරීමට සීමාවක්

*6 වෙනි පිටුවට....*

Pray for **NEHEMIAH BIBLE**
**RESIDENTIAL / EVENING COLLEGE,**
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
*Registered Candidate for Membership*
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders & Senior Pastors for the past 53 years
**Certificate in Theology : One year**
**Diploma in Theology : Two years**
Qualification : 10th Standard & above
Rush for admission!
**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජූනි:19-** ජූනි 03 වනදා පැවැත්වූ නෙහෙමියා බයිබල් විදුහලේ උපාධි ප්‍රදානෝත්සවයට ආශිර්වාද කල දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරන්න.

**ජූනි:20-** මැයි 10 වනදා පැවැත්වූ නෙහෙමියා බයිබල් විදුහලේ ආදිශිෂ්‍ය උත්සවයට ආශිර්වාද කල දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:21-** ප්‍රධාන ආරාධිත දේව දාසයා වූ පෝල් එබනේසර් දේවගැතිතුමා ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:22-** ග්ලෝබල් විෂන් ෆෝ යූත් & කිඩ් කෙයා යාච්ඤා සේවය ආරම්භ කර ඒ තුළින් ලෝකයේ දරුවන් ගැන යාච්ඤා කිරීමට ආශිර්වාදය ඉල්ලා ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:23-** නියමිත වේලාවට කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත නිකුත්කිරීමට උනන්දුවකින් සහභාගී වන සහකාර කතෘවරුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:24-** නෙහෙමියා බයිබල් විදුහලට ප්‍රමාණවත් සිසුන් ලැබෙන ලෙස ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:25-** වර්ෂ 1969 සිට පවත්වාගෙනඑන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:26-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේසන් විදුහලට ප්‍රමාණවත් සිසුන් ලැබෙන ලෙස ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:27-** දේව සේවාවන් සඳහා අවශ්‍ය මූල්‍යමය උපකාර ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:28-** නෙහෙමියා බයිබල් විදුහලේ සහ ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ 2022 - 2023 අධ්‍යන වර්ෂවල ප්‍රගතිය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:29-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සෑම කිතුණුවෙක්ම ආශිර්වාද ලබන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**ජූනි:30-** කැඳවීමේ ප්‍රතිරාවය ප්‍රධාන සභාව තුළ පැවැත්වූ නිවාඩුකාලීන බයිබල් පාසල ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:01-** යාච්ඤා මැදිහත්කරුවන්, මහාඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහ ඔවුන්ගේ පවුල් වල අයට ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:02-** කැඳවීමේ ප්‍රතිරාවය U Tube සමාජ ජාලය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජූලි:03-** කැඳවීමේ ප්‍රතිරාවය සේවය මෙතෙක් පැමිණි ගමන් මාර්ගය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූලි:04-** අප්‍රිකා මහද්වීපයේ සුඩාන රාජ්‍යයේ පවතින දේශපාලන අස්ථාවරය ගැන යාච්ඤා කරන්න

**ජූලි:05-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ජීවිත කථාව ලිවීම ගැන යාච්ඤා කරන්න

**ජූලි:06-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අයට නිරෝගි සුවය ලැබීම ගැන යාච්ඤා කරන්න

**ජූලි:07-** ලෝකයේ සෑම කිතුණු සභාවකම පිබිදීම ගැන යාච්ඤා කරන්න

**ජූලි:08-** කැපවීමෙන් සේවය කරන අය කැඳවීමේ ප්‍රතිරාවය සේවයට ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූලි:09-** නැවතත් හිස ඔසවන කොවිඩ් වෛරස් ප්‍රභේද ගැන යාච්ඤා කරන්න

**ජූලි:10-** ග්ලෝබල් විෂන් ෆෝ යූත් & කිඩ් කෙයා යාච්ඤා සේවය ගැන යාච්ඤා කරන්න

**ජූලි:11-** කිතුණු දරුවන්ගේ දෙමාපියන්ට තම දරුවන් ගැන දිව්‍යමය මගපෙන්වීම ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූලි:12-** මිෂනාරිවරුන්ට දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූලි:13-** නෙහෙමියා බයිබල් විදුහලට ඉදිරි වසර සඳහා සිසුන් ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූලි:14-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලට ඉදිරි වසර සඳහා සිසුන් ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජූලි:15-** නිවාඩු කාලීන බයිබල් පාසල තුළින් ගැලවීම ලැබූ දරුවන් ගැන යාච්ඤා කරන්න

**ජූලි:16-** මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ දරුවන් ඉන් නිදහස් වන පිනිස යාච්ඤා කරන්න

**ජූලි:17-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ මූල්‍යමය අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න

**ජූලි:18-** මානසික ආතතියට පත්වූ අය ගැන යාච්ඤා කරන්න

*4 පිටුවෙන්....*

නැත. ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ දරුවන්ගේ ජීවිත වල උන්වහන්සේගේ කැමැත්ත ඉෂ්ඨ කිරීමට බලාපොරොත්තු සිටී.

***''ඉතින්' අප තුළ ක්‍රියා කරන්නාවූ බලයේ හැටියට අප ඉල්ලන නොහොත්' සිතන හැම දේ'ට වඩා ඉතා අධික ලෙස කරන්'ට බලය ඇත්තාවූ තැනැන්'වහන්සේටම, (එපීස 3:20)***

උන්වහන්සේ පවසන්නාවූ දෙය නම්, උන්වහන්සේ අප සිතනවාට වඩා දේ කරන බවයි. එයයි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලය. ඔබ තවමත් මෙම බලය අත්දැක නොමැති නම්, උත්සාහ කර බලන්න. ඔබට ඇදහිල්ල තිබේ නම්, උන්වහන්සේගෙන් ඉල්ලන්න. උන්වහන්සේ ඔබ ඉල්ලනවාටත් වඩා ඔබ සිතනවාටත් වඩා දෙන්නාවූ දෙවියන්වහන්සේයි. මෙය අත්දැක බලන්න.

දෙවියන්වහන්සේ ඔබට යමක් කිරීමට යනවා නම් සමහර විට එය අපට මහන්සි බවක් දැනේ නම් එය කරන්න. මන්ද උන්වහන්සේ දෙවියන්වහන්සේයි. උන්වහන්සේ පවසනවා නම් අප කලබල වෙන්නේ ඇයි? අපට කරන්න තිබෙන්නේ උන්වහන්සේ අපට පවසන්නාවූ දේ පමණි. යෝබ්ගේ පොතෙහි මෙසේ සඳහන් කරයි. ***''සොයා දැනගන්'ට බැරි මහත්' දේද ගණන්' නැති පුදුම දේද උන්'වහන්'සේ' කරනසේක.''***

දෙවියන්වහන්සේ දෙන්නට යන්නාවූ දේශයට යන පිණිස අප කල යුත්තේ සූදානම් වී ඉදිරියට යාම පමණි. දෙවියන්වහන්සේ ඔබට දෙන්නාවූ දේශය අත්පත් කර ගැනීමට කාලය මෙයයි. ඔබ අවට තිබෙන්නාවූ වාතාවරණය දෙස නොබලන්න. පවුලේ පසුබිම, ආර්ථික තත්වය, ඔබගේ සුදුසුකම් හා නුසුදුසුකම්, අත්දැකීම්, වයස, ඔබ ස්ත්‍රීද පුරුෂද ආදී දේ නොබලන්න. මේ සැම දේට වඩා අපගේ ස්වාමීවූ දෙවියන්වහන්සේට ක්‍රියා කල හැකිය. එකම ප්‍රශ්නය නම් ඔබ සූදානම්ද?

මා සිටගෙන සිටින්නේ කොතැනද කියා මා දනිමි. දෙවියන්වහන්සේ මාව ගෙන යන්නේ කොහාටද කියා මා දනිමි. එම නිසා මගේ ජීවිතයේ 'අ' සිට 'ආ' දක්වා යා යුතුයි. අපගේ අවධානය මතෙව් 13 වන පරිච්ඡේදය වෙත යොමු කිරීමට කැමැත්තෙමි. එය අපගේ ඉරුදින සබත් පාසැලේ ඉගෙන ගන්නාවූ ඉතා ජනප්‍රියවූ පාඩමකි. එය වපුරන්නාගේ උපමා කථාවයි. වපුරන්නා වැපුරූ බීජ බිම් 4 ක වැටුණි. ඔබ ඒ අතරින් කුමන පොළොවද? අප බොහෝ දෙනෙක් සරු පොළොවක්ය කියා පවසයි. අප සරු පොළොවක්ය කියා බලාපොරොත්තුවක් තබා ගැනීමට හැකි නමුත් සැබෑ තත්වය ඊට හාත්පසින්ම වෙනස්වූවකි. අපගේ ජීවිතයේ ඉතා වැදගත් වන්නේ අප දරන්නාවූ ඵලය නිතරම ක්‍රියා කරන්නාවූ දෙයටත් අතර විශාල වෙනසක් තිබේ. මගේ පුතාට දැන් වයස 12 කි. ඔහු ඉතාම දක්ෂ පාපන්දු ක්‍රීඩකයෙකි. ඒ ගැන මා දෙවියන්වහන්සේට ස්තුති කරමි. ඔහු මේ ක්‍රීඩාව සඳහා පුහුණුවන කාලයේදී එය බැලීමට මාද ඔහු සමඟ ගියෙමි. ඔහු පාපන්දුව ළඟට ගොස් එයට පයින් ගයා එය කොහොමද ගියේ කියා බැලීමට උඩ බලයි. එම පාපන්දුව ඔහු ළඟ සිට ඉදිරියට යනු ලැබුවේ අඩි කිහිපයක් දුරකට පමණි. පසුව මාගේ පුතා මා ළඟට පැමිණ මහත් සිනා මුහුණකින් යුතුව, 'අම්මේ, මම ගහපු පාර ඔයා දැක්කද?'' කියා මගෙන් ඇසුවේය. 'ඔයා ගහපු පන්දුව කොහාටවත් ගියේ නැහැ' කියා මට කියන්නට සිතුනද හැම අම්මා කෙනෙක්ම පවසන ආකාරයට ඔහුට ධෛර්‍යයමක් වචනයක් පැවසුවෙමි. 'ඒක ඉතා අලංකාර පහරක්' ය කියා පැවසුවෙමි. එවිට මාගේ පුතාගේ මුහුණේ මහත් සතුටක් දුටුවෙමි. සැබෑ තත්වයට වඩා ඔහුගේ බලාපොරොත්තුව තිබුනේ වෙනස්වූ ආකාරයකටය. අපගේ බලාපොරොත්තුව වන්නේ අප සරු පොළොවක සිටීමයි. නමුත් ඔබ සිටින්නාවූ තත්වය දකින්නේ ඔබ පමණි.

මතෙව් 13:4 හි මෙසේ පවසයි. ***''වපුරන්'නා වපුරන්'ට ගියේය, ඔහු වපුරන කල්හි සමහර බීජ මග අසල වැටුණේය. පක්ෂීහු ඇවිත්' ඒවා අවුලා කෑවෝය''*** පාර දිගේ වැටුණු බීජ...පක්ෂීන් පැමින ඒවා රැගෙන ගියෝය.

19 වන පරිච්ඡේදයෙහිදී යේසුස්වහන්සේ මෙම උපමාව තම ගෝලයන්ට පැහැදිලි කර දුන්නේය.

***මතෙව් 13:19 ''යමෙක්' රාජ්‍යයේ' වචනය අසා තේරුම් නොගන්නේද, ඔහුගේ සිතේ වපුළ දේ නපුරා ඇවිත්' උදුරාගන්නේය. මග අසල වපුරන ලද්දේ' නම් මොහුය.''***

මෙම පදයෙන් කරුණු 2 ක් මා ඔබ සමඟ බෙදා ගැනීමට කැමැත්තෙමි. දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන දේ අප අත්පත් කරගන්නට පිණිස අපව නතර කරන්නේ මොනවාද? කියා දැනගැනීමට දෙවියන්වහන්සේ අපට උපකාර කරන සේක.

යේසුස් වහන්සේ පළමු පොළොව ගැන සඳහන් කරන විටදී උන්වහන්සේ පවසන්නේ නපුරා පැමිණ බීජය රැගෙන යන බවයි. දෙයවින්වහන්සේගේ වචනය අපගේ හදවත් තුළ යමක් කිරීමට පෙර නපුරා පැමිණ එය රැගෙන යයි. මෙය සැබෑ ජීවිතයෙන් වෙනස් වන්නේ කෙසේද?

ඔබට මා කුඩා කථාවක් පැවසීමට කැමැත්තෙමි. දිනක් යක්ෂයා ඔහු සමඟ වේගයෙන් බිමට වැටුණාවූ දූතයන්ට ආරාධනා කරමින් රැස්වීමක් පැවැත්විය. සෙනඟ දෙවියන්වහන්සේගේ කැමැත්ත නොකරන පිණිස ඔවුන්ට බාධා කරන්නේ කෙසේද? සාකච්ඡා කල විටදී ඒ සඳහා ඔහුට බොහෝ ආයුධ තිබුණි. එනම්, මිණී මැරීම්, ඊර්ෂ්‍යාව, සොරකම, බොරුව ආදී බොහෝ දේවල්ය. නමුත් මේ සඳහා මේ සඳහා බැරෑරුම් කාරණාවන් 2 ක් ගැන ඔවුන්ගේ අවධානය යොමු විය. එනම්,

**අධෛර්‍ය කිරීම සහ සිත එකඟ නොවීමයි.**

දෙවියන්වහන්සේගේ දරුවන්ගේ ජීවිත විනාශ කිරීමට අද යක්ෂයා පාවිච්චි කරන්නාවූ බලවත්ම ආයුධය නම් සිත එකඟ නොවීමයි. අප එක් දෙයක් මතකයේ තබා ගැනීමට අවශ්‍යය. එනම්, දෙවියන්වහන්සේගේ සැලැස්ම අපගේ ජීවිතය තුල ක්‍රියා කිරීමට අප සූදානම් නොමැති නම් යක්ෂයා උගේ සැලැස්ම අපගේ ජීවිතය තුළ ක්‍රියා කිරීමට සලස්වයි. එසේ නොමැති නම් ඔබ දේව කැමැත්ත තුළ නොසිටීනම් ඔබ සිටින්නේ යක්ෂයාගේ කැමැත්ත තුලය. මෙය පිළිගැනීමට අමාරු වුවත් සත්‍ය නම් මෙයයි.

ඔබ දෙවියන්වහන්සේට සේවය කරන්නාවූ කෙනෙක් නම්, ඇත්ත වශයෙන්ම ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ සිටිනවාද? ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් සේවය කරනවාද? එසේ නොමැතිනම් දෙවියන්වහන්සේ සමඟ සේවය කරනවාද? මා ඇතුලු බොහෝ දෙනා සිතන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් අප කරන්නාවූ සේවය බවයි. නමුත් එය සත්‍ය නොවෙයි. දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්ද කියා අපි නොදැන අලුත් අදියරකට ගමන් කල නොහැකිය. අලුත් දෙයක් කිරීමටද නොහැකිය.

අපගේ සිතින් අපි එකඟ නොවනවා නම් දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට අපට අමාරුය.

ඔබගේ සිත එකඟ නොවීමට ඇති කාරණා සමහර විට දී ඔබටම සිතා ගැනීමට නොහැකිය. යක්ෂයා ඉතා රැවටිලිකාරය, කපටිය. දෙවියන්වහන්සේගේ කාරණාවන් වලට ඔබගේ සිත එකඟ නොවන ආකාරයට යක්ෂයා ඔබව රැවටීමට පුළුවන.

උත්පත්ති 3:6 හි, ඒව ඒ ගෙඩිය දැක එය ඇගේ ***ඇස් වලට ප්‍රියවන්නාවූ*** දෙයක් ලෙස තිබුණි.

.... එම ගස ඉතා ***ලස්සනය*** හා එහි පෙනීම ***සිත ඇදගන්නා*** සුළු දෙයක් නිසා ඇයට ***නුවණ ලබා ගැනීමට*** අවශ්‍ය විය.

මෙය ඇස්වල ***තෘෂ්ණාවයි.***

එය ඇස්වලට ප්‍රියව හා අලංකාරව තිබුණද ඇයට අවශ්‍ය වූයේ නුවණ ලබා ගැනීමටය. ඇගේ මේ සිතුවිල්ල වැරදිද? මේ දේ පැමිණුනේ යක්ෂයාගෙන්ද? අද හැම කෙනෙක්ම ආශා වන්නේ මේ දෙයට නොවේද? මෙය විනාශයක් ලෙස පෙනෙනවාද?

ඉතා ලස්සනව. ප්‍රියමනාපව, ප්‍රඥාව ලැබෙනවාය කියා සිතන දෙයෙහි වරදක් තිබේද? නමුත් මිනිස් සංහතියේම වැටීමට මුල වූයේ මෙයයි. මන්ද දෙවියන්වහන්සේගේ වචනයට එකඟ නොවී තමා දකින දෙයටත් ප්‍රියවන දෙයටත් තමාගේ ජීවිතය යොමු කිරීමයි. යක්ෂයා අපගේ සිතට පහර දෙනු ලබන්නේ මෙවැනි අවස්තාවේදීය.

'මම ඔබ සමඟ මැරෙන්න සූදානම්' කියා ප්‍රේතුස් පවසනු ලැබීය. ඔහු ශක්තිමත් පුද්ගලයෙක්ය, කියා ඔහු සිතුවේය. 'ඔහුගේ ප්‍රේමය යේසුස් වහන්සේ කෙරෙහි බලවත්ව ඇති බවත් කිසි ලෙසක එය වෙන්කල නොහැකි බවත් ය කියා ඔහු යේසුස් වහන්සේට පැවසීය. නුමුත් යේසුස් වහන්සේ ඔහුට පිළිතුරු දෙමින්, 'කුකුළා හැඬලීමට පෙර ඔබ මාව තුන්වරක් හඳුනන්නේ නැත' කියා පවසයි කියා කීය.

*9 වෙනි පිටුවට....*

**A good opportunity to get Echo of His Call monthly magazine at free of cost**

If you could send the addresses of your friends / relatives through post, letter, e.mail, WhatsApp or phone to us, we will dispatch **Echo of His Call** monthly magazine to them at free of cost.



**Echo of His Call**

***Christian YouTube Channel!***

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

**Message & Prayer in 5 minutes!!**

**English, Hindi, Tamil & Telugu**

Every day – 5.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** *(මතෙව් 24:15)*



# THE LORD WHO GRANTS OUR DESIRES!

*''නුමුත් වරක් දුර සිටියාවූ නුඹලා දැන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ උන්වහන්සේගේ ලේ කරණකොටගෙන ළංකරනු ලැබුවහුය.'' (එපීස 2:13)*

මගේ වයස අවුරුදු 18 ක්ම තිබූ කාලයේදී මගේ පියාත් ඔහුගේ සහෝදරයනුත් පවුලේ සාමාජිකයිනුත් සභාවේ ගායනා කරමින් නමස්කාර කරන ආකාරය මා දුටුවෙමි. මාද මට හැකි ලෙස ඔවුන්ට උදව් කලෙමි. මාද හාමෝනියම් නැමති සංගීත භාණ්ඩය වාදනය කිරීමට ඉගෙන ගතිමි.

ඒ දේ තුළින් 'සුභාරංචි යාච්ඤා කණ්ඩායම' නමින් කණ්ඩායමක් පටන්ගෙන අප සභාව තුළ සහ තවත් ස්ථානයන් වලට ගොස් යාච්ඤා කර නමස්කාර කිරීමේ සේවයක් කරගෙන ගියෙමි. මේ දේ තුළින් බොහෝ ගම්මාන වලට සුභාරංචිය බෙදා දුන්නෙමි. අප කණ්ඩායමක් ලෙස වාදනය කරමින් දේව වචනය බෙදා දී සාක්ෂි දරමින් සේවය කලෙමි. එම කණ්ඩායමේ සිටි ප්‍රධාන පුද්ගලයින් නම්, සහෝදර වෙස්ලි දේව දාසන්, පූජක ඒ. සෙල්වරාජ්, දේවගැති ජෝන් රෝස් කමලන්, සහෝදර ඩේවිඩ් රෙජිනෝල්ඩ්, පූජක පාවුලු, ජෙයචන්ද්‍රන් මහතා හා ජයනන්ද බාලුමනි මහතාය.

ඉතා විශාල හා බරැති එම හමෝනියම් සංගීත භාණ්ඩය මගේ කර මත තබාගෙන ගම්මානවලත්, පොළවල්වලත්, මහපාරේ අයිනෙත් සිට ගායනා කරමින් මගේ සාක්ෂිය බෙදා ගනිමින් දේව වචනය ප්‍රකාශ කලෙමි. මා මේ සියල්ලම මගේ මුළු හදවතින් ඉතා සතුටින් හා ප්‍රීතියෙන් යුතුව කලෙමි. බොහෝ අවස්ථාවන් වලදී මා මෙම හමෝනියම් එක කරෙහි තබාගෙන කිලෝමීටර් ගණනාවක් පයින්ම ගමන් කරමින් සුභාරංචිය දේශනා කලෙමි.

අද මා එම ස්ථාන වලට යන විටදී මා තරුණ කාලයේදී වාදනය කර ගායනා කරමින් සුභාරංචිය ප්‍රකාශ කල සෑම ස්ථානයකම සභාවන් ආරම්භ වී ඇති අතර කිතුණුවන්ගේ සංඛ්‍යාවද වැඩි වී ඇති බවකි. මා කිසිම පුහුණුවක් නොමැතිව, සමාජයේ කිසිම පිළිගැනීමක් නොමැති අවස්ථාවන් වලදී කළාවූ සේවය මා නිතරම සිහි කරමි.

දින ගණන් ගතවී තිබේ. දෙවියන්වහන්සේ මා හට පියවරෙන් පියවර ආශිර්වාද කිරීමට පටන්ගත්තේය. උන්වහන්සේ මට සෑම අතින්ම, මනුෂ්‍යයන්ගේ උපකාරයන් හා ආර්ථික අවශ්‍යතා සපයමින් උපකාර කරයි. එසේම දෙවියන්වහන්සේ මා හට 'එකෝඩියම්' සංගීත භාණ්ඩයද ලබා දී තිබේ. මෙම වාද්‍ය භාණ්ඩය ලබා ගැනීමට මා හට මුදල් නොමැති අවස්ථාවන් වලදී මගේ එක්තරා මිත්‍රයෙක් වූ පද්මනාදන් ඔහුගේ භාර්යාවගේ රත්‍රං මාලය විකුණා එම මුදලින් මෙම සංගීත භාණ්ඩය මා හට ලබා දුන්නේය. මගේ සහෝදරයා වන එස්. සෑම් රාජ්ද මා හට උපකාර කලේය.

එසේම රූපවාහිනී නාලිකා තුළින්ද YouTube හරහාද දේව පණිවිඩය දෙමළ, ඉංග්‍රීසි, හින්දි හා තෙලිගු භාෂාවන් වලින් බෙදා ගැනීමට මගේ දෙවියන්වහන්සේ මා හට ආශිර්වාද කලේය. එසේම අපගේ මව් සභාවට ගායනා කිරීමට හා සංගීතය වාදනය කිරීමට අවශ්‍ය සියලුම වාද්‍ය භාණ්ඩ හා උපකරණ බොහොමයක් උන්වහන්සේ අපට ලබා දී තිබේ. තවද තවත් බොහෝ සභාවන් ස්ථාපිත කිරීමට උන්වහන්සේ උපකාර කලේය.

ප්‍රිය මිත්‍රය, ඔබටත් දෙවියන්වහන්සේට යමක් කිරීමට ආශාවක් තිබේ නම්, දැන්ම යමක් ආරම්භ කරන්න. මේ සඳහා ඔබට උපකාර කිරීමට කිසිවෙක් නොමැති වීමට පුළුවන. නමුත් ඒ සඳහා ඔබට හදවතක් හා ආශාවක් ඇතිනම් දෙවියන්වහන්සේ ඔබට උපකාර කරයි. ප්‍රමාද නොවන්න. අදම එය ආරම්භ කරන්න.

***''මක්නිසාද තමන්වහන්සේ යහපත් කැමැත්ත නිසා කැමතිවෙන්ටත් වැඩකරන්ටත් නුඹලා තුළ ක්‍රියාකරන්නේ දෙයවින්වහන්සේමයි.'' (පිලිප්පි 2:13)***

*7 වෙනි පිටුවෙන්....*

ප්‍රිය මිත්‍රවරුනි, ඔබ ශක්තිමත්ය, බලවත්ය කියා සිතනවා නම් ඔබගේ ජීවිතය ගැන වැඩි වැඩියෙන් යාච්ඤා කරන්නය කියා මා ඔබට පැවසීමට කැමතිය. ඔබගේ දරුවෝ, ඔබගේ පවුල, ඔබගේ ජීවිතයේ සියලුම අංශ, ඔබගේ සේවය, ඔබගේ කැඳවීම, ඔබගේ වැඩ, ඔබගේ ආලේපය ආදී සියල්ල ගැන යාච්ඤා කරන්න. මන්ද අපට ඉදිරියට යාමට දෙවියන්වහන්සේගේ බලය අවශ්‍ය වෙයි. එසේ නොවුනහොත් අප වැටෙනු ඇත. එසේම දෙවියන්වහන්සේ අපගේ ජීවිතය කෙරෙහි තබා තිබෙන්නාවූ සැලැස්ම අපි නැතිකරගනු ඇත.

යක්ෂයා කාව ගිලගනිම්දෝ කියමින් ගොරවන සිංහයෙකු මෙන් ඔබ මොබ ඇවිදමින් සිටියි. 1 පේත්‍රුස් 5:8 හි "ඔබ සිහි ඇතිව අවධියෙන් සිටින්නය" කියා පවසයි.

ඔබ ඔබගේ ජීවිතයෙහි සමබරව, ව්‍යානුකූලව හා ඉතා ප්‍රවේශමෙන් සෑම මොහොතක්ම ගත කරන්න. මන්ද යක්ෂයා ඔබව රැවටීමට ඉතා රැවටිලිකාරව සිටී.

මා ඔබගේ පිටට තට්ටුවක් දමා 'ප්‍රවේශම් වෙන්න, අවධියෙන් සිටින්න, විනයානුකූලව ජීවත්වෙන්න' ඔබගේ ජීවිතයේ ඇති අනවශ්‍ය දේ අත්හැර දමා පුද්ගලික ලෙස දෙවියන්වහන්සේ ඔබට කතා කරන්නය කියා යාච්ඤා කරන්න. ස්වාමීන්වහන්සේගේ කැමැත්ත ඔබට පෙන්වන්නය කියා නිරාහාරව යාච්ඤා කරන්න. මන්ද යක්ෂයා අපව විනාශ කිරීමට බලා සිටී.

මගේ යාච්ඤාව නම්, විශේෂයෙන්ම මෙම අන්තිම කාලයේදී දෙවියන්වහන්සේගේ සැලැස්මෙන් ලිස්සා යන්නේ නැතිව දේව කැමැත්ත පමණක් කිරීමට අපිව සූදානම් කර ගනිමු. අපගේ ජීවිතයේ යක්ෂයා ගෙනෙන්නාවූ මුලා කිරීම් නිසා දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අපව ඈත් කරන එක පමණක් නොව අපව විනාශයට ගෙනයනු ඇත.

දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් උන්වහන්සේගේ දරුවන් වන ඔබට ආශිර්වාද කිරීමයි. උන්වහන්සේගේ දරුවන්ට විරුද්ධව ක්‍රියා කිරීමට කිසිම නපුරකට නොහැකිය. නමුත් සමහර අවස්ථාවන් වලදී අපගේ ජීවිතයේ මෙවැනි දේ සිදු වීමට පුළුවනි. නමුත් ස්වාමීන්වහන්සේගේ බලය කරණකොට ගෙන අපට ජයගැනීමට හැකිය.

අප දේව වචනය දෙස බලන විටදී මෝවාබ් දේශයේ රජ ඉශ්‍රායෙල්ට ශාප කරන පිණිස බාලාම්ට එන්න කියා පැවසීය. දෙවියන්වහන්සේගේ සෙනඟට ශාප කිරීමට බාලාම්ගේ සිත තුළ මහත් වූ සටනක් තිබුණි. එම නිසා ඔහු දෙවියන්වහන්සේගේ සෙනඟට ආශිර්වාද කරනු ලැබීය. එවිට මෝවාබ් රජ මහත් සේ කෝපයට පත් විය. අවසානයේදී බාලාම් "මේ අය දෙවියන්වහන්සේගේ සෙනඟයි. උන්වහන්සේගේ කැමැත්ත නම් ඔවුන්ට ආශිර්වාද කිරීමයි. එම නිසා ඔවුන්ට ශාප කිරීමටවත් ඔවුන්ව විනාශ කිරීමටවත් මට බැහැ. නමුත් ඔවුන්ව පරාජය කිරීමට ඔබට පුළුවනි. එනම්, ඔවුන්ව මුලා කිරීමට ඔබට පුළුවනි. එවිට දෙවියන්වහන්සේම ඔවුන්ව විනාශ කරනු ඇත."

***"මෝසෙස්ද ස්වාමීන්වහන්සේ තමාට අණකල ප්‍රකාර ඔවුන් ගණන්කලේය..." (ගණන් කථාව 3:16)***

බාලාම්ගේ උපදෙස නම්, මෝවබ් හි කාන්තාවන් ඉශ්‍රායෙල්වරුන් වෙතට එවීමයි. එවිට ඔවුන් ඉශ්‍රායෙල්හි පුරුෂයින් සමඟ ලිංගික සම්බන්ධකම් පවත්වමින් ඔවුන්ගේ නමස්කාරයන් වලට ඇතුල් වෙයි. මේ ආකාරයට ඉශ්‍රායෙල් පුරුෂයන් මෝවබ් කාන්තාවන් සමඟ සම්බන්ධතාවයක් පැවැත්වූ අතර ඔවුන්ගේ නමස්කාරයන් වලටද සම්බන්ධ විය.

ඉශ්‍රායෙල් පුරුෂයන්ගේ දුර්වලතාවය ගැන බාලාම් දැනගෙන සිටි අතර අන්‍ය දෙවිවරු පසුපස යාම දෙවියන්වහන්සේ අකමැති වන්නාවූ කාරණයක් බවද දැනගෙන සිටියේය. උන්වහන්සේ හැර වෙන කිසිම කෙනෙකුට නමස්කාර කිරීම උන්වහන්සේ අප්‍රිය කරන බවත් ඔහු දැන සිටියේය. එම

ප්‍රිය පාඨකයෙනි,

කරුණාකර පහත සඳහන් ඇති කොටස කියවා එයට ඔබ එකඟවෙනවාද නැත්ද යන්න ලකුණු කර අපට වෙතට එවන්න. එවිට කැඳවීමේ ප්‍රතිරාවය සේවයෙන් ඔබට ත්‍යාගයක් හිමිවනු ඇත.

1. අද ඔබ කැඳවීමේ ප්‍රතිරාවය සේවය ගැන යාච්ඤා කලාද?
2. කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව ඔබට දිගටම ලැබෙනවාට කැමතිද?
3. තවත් කීප දෙනෙක්ට කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව බෙදා හැරීමට කැමතිද? (මුදල් අවශ්‍ය නැත)
4. මෙම සඟරාවෙහි ඔබ කැමති කුමන කොටසටද? ප්‍රධාන පණිවිඩය /කර්තෘ වැකිය /පාලු වලකින් මාළිගාවට
5. අපගේ WhatsApp අංකය ඔබ ඔබගේ දුරකථනයෙහි දමාගෙන තිබේද?
6. අපගේ YouTube චැනලයට Subscribed කර තිබේද?
7. ඔබ අපගේ YouTube කෙටි පණිවිඩයට ඇහුම්කන් දෙනවාද?
8. ඉංග්‍රීසි, සිංහල, හින්දි හා තෙලිගු භාෂාවෙන් විකාශනය වන විනාඩි 5 ක පණිවිඩය ඔබ නරඹනවාද?

***මෙම කොටස කපා අප වෙතට ලැබෙන්නට සලස්වන්න.***

RNI NO. TN/SIH/2006/17846

නිසා බාලාම්ගේ උපදෙස් කරණකොටගෙන දෙවියන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේට විරුද්ධව ක්‍රියා කිරීමට පටන්ගත්තා.

ප්‍රිය මිත්‍රවරුනි, ඔබ ගමන් කරන්නාවූ තත්වය මා හොඳින්ම දනී. ඔබගේ ජීවිත ගමනේ ඔබ ගමන්කරන්නේ කෙසේද කියා මා නොදනිමි. නමුත් යක්ෂයාගේ දේ වලට මුලා නොවන ලෙස ඉතා ප්‍රවේශම් වෙන්න. ඔබගේ ඇස්වල තෘෂ්ණාවන් වලට අනුව නොයන්න. දෙවියන්වහන්සේ ඔබට දෙන්නාවූ දේ ගැන සතුටු වෙමින් ඒ දේ තුළ ගමන් කරන්න. ඔබට බලය දෙන්නය කියා දිනපතාම යාච්ඤා කරන්න.

තරුණ තරුණියනි, ඔබගේ විවාහය සම්බන්ධයෙන් ප්‍රවේශම් වෙන්න. අන්‍ය භක්තිකයින් සමඟ තිබෙන්නාවූ ප්‍රේම සම්බන්ධතා අත් හරින්න. ඔබගේ සහකරු හෝ සහකාරිය දෙවියන්වහන්සේ සමඟ ගමන්කරන්නාවූ කෙනෙක් විය යුතුය.

මෙය කියවන්නාවූ සෑම කෙනෙක්ම සියලු මුලාවන්ගෙන් මිදී දෙවියන්වහන්සේ තුල ඉදිරියට යාමට උපකාර කරන අතර අලුත් කර්තව්‍යකට යාමට උන්වහන්සේ උපකාර කරන සේක. ඉදිරියට යාමට සූදානම් වෙන්න.

ඔබ සිතනවාටත් වඩා ඔබ ඉල්ලනවාටත් වඩා මහත් වූ දේ කිරීමට දෙවියන්වහන්සේට පුළුවනි. ඔබගේ ජීවිතයේ අලුත් කර්තව්‍යකට යාමට සූදානම් වෙන්න. දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

*************

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852

E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

on 2nd **JUNE 2023.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

**P.O. Box No. 2957,**

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**